රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 235

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.
1984 ජනවාරි මස 6 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1982 දෙසැම්බර් 01 දින දරණ ශ්‍රී ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය**

**ශ්‍රී ලංකා පරිපාලන සේවයට විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පත් කරන ලද නිලධාරීන් රු. 24,000 වැටුප් තලයක් මත පිහිටුවීම පිළිබඳ 24 (ඇ) ඡේදය සංශෝධනය කිරීම**

1978 සැප්තැම්බර් 07 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 124 සහ 1981 ජූනි 29 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 192 සම්බන්ධයෙන්,

1. ශ්‍රී ලංකා පරිපාලන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 24 (ඇ) ඡේදයේ සඳහන් රු. 24,000 (1982.01.01 දිනට පෙර රු. 11,520) වැටුප් තලය 1978.07.01 දින සිට රු. 25,200 (1982.01.01 දිනට පෙර රු. 12,480) වශයෙන් සංශෝධනය කර, ඒ අනුව ගෙවීම් කළයුතු බවත්,

11. හිඟ වැටුප් කිසිවක් නොගෙවිය යුතු බවත්,

තීරණය කර ඇත.

2. කරුණාකර පහත දැක්වෙන පරිදි කටයුතු කරන්න.

1. 1983.10.19 වැනි දින හෝ ඊට පසු සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 24 (ඇ) ඡේදයේ අවශ්‍යතාවන් සපුරාලන හෝ සපුරා ඇති නම්, ශ්‍රී ලංකා පරිපාලන සේවයට විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බඳවා ගෙන ඇති අයගේ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් 1981.06.29 වැනි දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 192 හි 3 වන ඡේදයේ සලස්වා ඇති පරිදි දිගටම කටයුතු කර ගෙන යා යුතුය. අවශ්‍ය ලිපිලේඛන ලැබුණු විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් එම නිලධාරීන් රු. 25,200 තව

/2....

වැටුප් තලය මත පි [illegible] ය.

11. 1978.07.01 සහ 1983.10.19 දක්වා කාලය තුළ රු. 24,000 (1982.01.01 දිනට පෙර රු. 11,520) වැටුප් තලය මත පිහිටුවනු ලැබූ, විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන්ගේ වැටුප් නැවත සකස් කළයුතු වේ. මෙවැනි අවස්ථාවලදී අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා

(අ) අදාල නිලධාරියා නියමිත දිනයේ දී රු. 25,200 වැටුප් තලය මත පිහිටුවනු ලැබුවාසේ සැලකිය යුතුය.

(ආ) මේ පදනම මත ඔහුගේ වැටුප නැවත සකස් කළයුතුය.

(ඇ) හිඟ වැටුප් කිසිවක් රහිතව 1983.10.19 දින සිට ඔහුගේ නව වැටුප ගෙවිය යුතුය.

(ඈ) ඔහු නව වැටුප මත පිහිටුවන ලිපියේ පිටපත සටහන් කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.

(බී. අයි. ගුණතුංග)
අතිරේක ලේකම්.

අ.ක./ ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.